සියලු ම හිමිකම් ඇවිරිණි/All Rights Reserved

# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
## Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| **තෙවන වාර පරීක්ෂණය 2020** | **11 ශ්‍රේණිය** |
| **மூன்றாம் தவணைப் பரீட்சை 2020** | **தரம் 11** |
| **Third Term Test 2020** | **Grade 11** |

| | | |
|---|---|---|
| **ඉතිහාසය** | **I** | **පැය එකයි** |
| **வரலாறு** | **I** | **ஒரு மணித்தியாலம்** |
| **History** | **I** | ***One hour*** |

**සැලකිය යුතුයි -**

**සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 80 ක් හිමි වේ. අංක 1 සිට 40 දක්වා දක්වා ප්‍රශ්නවල දී ඇති 1,2,3,4 පිළිතුරු වලින් නිවරැදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.**

**ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් , ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.**

(1) ගම්පොළ රාජ්‍ය සමයේ සිට කෝට්ටේ රාජ්‍ය කාලය දක්වා ඉතිහාසය හැදෑරීමේ වැදගත් සාහිත්‍ය මූලාශ්‍ර දෙකක් වන්නේ,

1. රාජාවලිය , දීපවංශය
2. රාජාවලිය , නිකාය සංග්‍රහය
3. රාජාවලිය , ගුත්තිල කාව්‍යය
4. නිකාය සංග්‍රහය , පූජාවලිය

(2) පනාකඩුව තඹ සන්නස අයත් වන්නේ කුමන රජුගේ පාලන සමයට ද?

1. I වන විජයබාහු රජු
2. I නිශ්ශංකමල්ල රජු
3. වසභ රජ
4. II වන පරාක්‍රමබාහු රජු

(3) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් පැරණිතම පුරාවිද්‍යාත්මක සාධක හමුවන්නේ මින් කුමන ස්ථානයෙන් දැයි තෝරන්න,

1. පාහියන්ගල
2. කුරුවිට බටදොඹ ලෙන
3. බෙලිගල
4. පොතාන

(4) පූර්ව ඓතිහාසික යුගයේ කාන්තාවන් විසින් ඇස් අඳුන් තැබීමට භාවිතා කරන ලෝහ කූරක් හමු වී ඇති පුරාවිද්‍යාත්මක ස්ථානය වන්නේ,

1. ඉබ්බන්කටුව
2. හල්දුම්මුල්ල
3. උඩරංචාමඩම
4. බෙරගල

(5) මුල් ඓතිහාසික යුගයේ දී ගම්වල නිෂ්පාදනය කරන ද වෙළඳාම පිණිස මහා නගර වෙත ගෙනයාම සම්බන්ධීකරණය කළ අතරමැදි ජනාවාස හැඳින් වූ නාමය වන්නේ,

1. පුරය
2. නුරපුර
3. ඔලගම්
4. නකර

- පහත දැක්වෙන තොරතුරු ඇසුරින් 6 - 7 ප්‍රශ්න සඳහා පිළිතුර සපයන්න

| |
|---|
| A - සිව , සුමන හා තිදන යන පුද්ගලයින් ගල් ගුහාවක් පිරිසිදු කොට පූජා කිරීම. |
| B - ශ්‍රී මහා බෝධි රෝපණ උත්සවය සඳහා ක්ෂත්‍රියන්ට ආරාධනා කිරීම. |
| C - ගමක ජීවත් වූ පුද්ගලයෙකු ඊළඟ කන්නයේ ලබාදෙන පොරොන්දුව පිට වී මල්ලක් ණයට ඉල්ලා ගැනීම |
| D - ඉන්දියානු සාගර කලාපයේ වර්ධනය වෙමින් පැවති ජාත්‍යාන්තර වෙළඳ සබඳතාවලට ශක්තිමත්ව මුහුණ දීම |
| E - ප්‍රාදේශීය පාලකයින් තිදෙනෙකු සමග සටන් කර ඒ ප්‍රදේශ අල්ලා ගනිමින් රජ බවට පත් වීම. |

(6) ගම්කවරයෙක් සම්බන්ධ ප්‍රකාශ දෙකක් දැක්වෙන පිළිතුර මින් කුමක්ද?

1. A හා B　　2. A හා C　　3. D හා E　　4. D හා B

(7) දේවානම්පියතිස්ස රජුගේ පාලන සමයට අයත් වන සිදුවීම් දැක්වෙන පිළිතුර කුමක්ද?

1. A හා C　　2. B හා C　　3. B හා D　　4. D හා E

(8) පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් පළමුවන විජයබාහු රජු සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න

1) කුඩා කාලයේ දී කීර්ති නමින් හැඳින්වීම
2) බුදල්නා නැමති රජයේ නිළධාරියෙකු යටතේ ඇති දැඩි වීම.
3) පොලොන්නරුව පාලන මධ්‍යස්ථානය ලෙස තෝරා ගැනීම.
4) මහාතිත්ථ වරාය මුල්කොටගෙන ජාත්‍යන්තර වෙළඳාමට සම්බන්ධ වීම.

(9) වෛද්‍ය ක්ෂේත්‍රයේ දියුණුව උදෙසා සේවය කළ පාලකයින් කිහිපදෙනෙක් I තීරුවෙහි සහ ඔවුන් විසින් සිදු කළ සේවාවන් II තීරුවෙන් දක්වා ඇත.. ඒවා එකිනෙකට ගැලපෙන සේ යා කළ පසු ලැබෙන නිවරැදි පිළිතුර ඇතුළත් වරණය තෝරන්න

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. බුද්ධදාස රජතුමා | A පසවන්ති නාම ශාලා නම් වූ ප්‍රසූතිකාගාර ඉඳි කිරීම. |
| 2. V වන මිහිඳු රජතුමා | B උපසග්ගරෝගනාස නම් වූ උණ රෝහලක් ඉඳි කිරීම. |
| 3. IV කාශ්‍යප රජතුමා | C රෝහල්වලට අවශ්‍ය පහසුකම් ලබා දිම. |
| 4. I වන උපතිස්ස රජතුමා | D රට පුරා රෝහල් ඉඳි කිරීම. |

1. ACBD　　2. BCAD　　3. CDBA　　4. DCBA

(10) මෙරට වරායන් ආශ්‍රිතව ජීවත් වූ දෙමළ ජාතිකයින්ගේ වන්දනාමාන කටයුතු සඳහා ඉඳි කරනු හින්දු කෝවිලක් වන්නේ,

1. තිරුකේතීශ්වරම් කෝවිල　　2. නල්ලූර් කෝවිල
3. ස්කන්ධකුමාර කෝවිල　　4. මුන්නේශ්වරම් කෝවිල

(11) දකුණු ඉන්දියානු කුලී හේවායින්ගේ සහය පැතූ පැරණිතම ශ්‍රී ලාංකික පාලකයා වන්නේ,

1. I වන විජයබාහු රජු
2. ඉළනාග රජු
3. ධාතුසේන රජු
4. වළගම්බා රජු

(12) ඇළහැර ඇළ මඟින් ජලය සපයනු ලබන වැව් අතරට අයත් නොවන වැව මින් කුමක්ද?

1. මින්නේරිය වැව
2. කවුඩුල්ල වැව
3. නාච්චිදූව වැව
4. ගිරිතලේ වැව

- **පහත තොරතුරු ඇසුරින් 13 හා 14 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න**

A පරමාණුව B පැළ C කුරුණි D ලික්බ E ආංගුල

(13) ඉහත තොරතුරු අතරින් දිග මැනීම හා සම්බන්ධ මිනුම් දෙකක් ඇතුළත් පිළිතුර කුමක්ද?

1. A හා B
2. A හා D
3. B හා C
4. C හා E

(14) ඉහත තොරතුරු අතරින් අවකාශය මැනීම හා සම්බන්ධ මිනුම් දෙකක් ඇතුළත් පිළිතුර කුමක්ද?

1. A හා B
2. B හා C
3. B හා D
4. C හා E

(15) අතීතයේ මෙරට සමාජයේ පැවති සමාජ ධූරාවලිය හා සම්බන්ධ නිවරැදි ප්‍රකාශය කුමක්ද?

1. ධනවත් වෙළඳ ප්‍රධානීන් හා වෛද්‍යවරු සමාජයේ සිව්වන ස්ථරයට අයත් වීම.
2. ගම්වැසියන්ගේ ගැටලු රජුට දැනුම් දෙනු ලැබුවේ '' කුඩීන් '' නම් පිරිස විසින් වීම.
3. මහා සංඝරත්නය සමාජයේ තුන්වන ස්ථරයට අයත් වූහ.
4. ඇමතිවරු , සේනාපතිවරු හා භාණ්ඩාගාරිකවරු සමාන බලතල ඇති අය වූහ.

(16) භික්ෂූන් වහන්සේ කෙනෙකුහට අතුරුපසක් ලෙස තල පූජා කිරීමක් පිළිබඳව සඳහන් ශිලා ලේඛනය කුමක්ද?

1. කොක්ඇබේ ශිලා ලිපිය
2. බ්‍රාහ්මණයාගම ශිලා ලිපිය
3. සිතුල්පව්ව ශිලා ලිපිය
4. තෝණිගල ශිලා ලිපිය

- පහත වගුවෙහි A සිට I දක්වා සපයා ඇති තොරතුරු ඇසුරෙන් 17 සහ 18 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

| | | |
|---|---|---|
| A 1215<br>B 1236<br>C 1405 | D ගම්පොළ<br>E පොලොන්නරුව<br>F දඹදෙණිය | G කාලිංග මාඝ ආක්‍රමණය<br>H චෙන්හෝ සෙනවියා පැමිණීම<br>I II වන පරාක්‍රමබාහු රජ වීම. |

(17) දඹදෙණි රාජධානි සමයට අදාළ සිදුවීමක් දැක්වෙන පිළිතුර කුමක්ද?

1. AFH
2. AFG
3. BFI
4. CDI

(18) ගම්පොළ රාජධානි සමයට අදාළ සිදුවීමක් දැක්වෙන පිළිතුර කුමක්ද?

1. CDH
2. BDI
3. ADG
4. CDG

(19) සෙනරත් රජු විසින් උඩරට රාජධානිය කොටස් තුනකට බෙදා කුමාරවරුන්ට පවරා දීමේ දී මාතලේ ප්‍රදේශයේ පාලනය කරනු ලැබුවේ?

1. විජේපාල කුමරු
2. රාජසිංහ කුමරු
3. කුමාරසිංහ කුමරු
4. කොනප්පු බණ්ඩාර කුමරු

(20) උඩරට රාජධානියෙහි පරිපාලන ක්‍රමය තුළ රට වසම නම් පරිපාලන ඒකකය හා සම්බන්ධ නිළධාරියෙකු නොවන්නේ මින් කවුරුන් ද?

1. රටේ මහත්තයා
2. මුහන්දිරම්
3. ලියන රාල
4. උණ්ඩිය රාල

- අංක 21 සිට 22 දක්වා ප්‍රශ්න සඳහා A හා B ලෙස තීරු දෙකක් සපයා ඇත. එක් A තීරුවේ ඇති ප්‍රකාශ හෝ නාම B තීරුව සමග ගැලපූ විට ලැබෙන නිවරැදි පිළිතුරු කාණ්ඩය වන්නේ,

(21) ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසි පාලනය සම්බන්ධයෙන් නිවරැදි පිළිතුරු කාණ්ඩය වන්නේ,

| A තීරුව | B තීරුව |
|---|---|
| 1. ෆ්‍රැන්සිස්කු ද අල්මේදා | A දන්තුරේ සටන මෙහෙයවීම. |
| 2. ලොරෙන්සෝ ද අල්මේදා | B 1505 දී ලංකාවට පැමිණීම. |
| 3. පිලිප් ද ඔලිවේරා | C සෙයිලන් (ලංකාව) සොයාගත යුතු බවට උපදෙස් ලැබීම |
| 4. පේරෝ ලෝපේස් ද සූසා | D යාපනය යටත් කිරීම. |

1. ACBD 2. BADC 3. CBDA 4. DBAC

(22) ලංකාවේ ලන්දේසි පාලනය සම්බන්ධයෙන් නිවරැදි තොරතුරු අඩංගු පිළිතුරු කාණ්ඩය තෝරන්න,

| A තීරුව | B තීරුව |
|---|---|
| 1. ජොරිස් වැන් ස්පිල්බර්ජන් | A දෙවන රාජසිංහ රජු සමග ගිවිසුමකට එළඹීම.. |
| 2. සිබල් ද වර්ට් | B උඩරට රාජධානියට පැමිණි දෙවන ලන්දේසි දූතයා වීම. |
| 3. වෙස්ටර් වර්ල්ඩ් | C සේනාංක 6 ක් සමග උඩරට ආක්‍රමණය කිරීම. |
| 4. බැරන් වැන් එක් | D I වන විමලධර්මසූරිය රජු හමුවීම. |

1. ACBD 2. BDCA 3. CDBA 4. DBAC

(23) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවීම සම්බන්ධයෙන් ප්‍රකාශ යුගළ හතරක් පහත දැක්වේ. ඒවා අතුරෙන් නොගැලපෙන ප්‍රකාශ යුගළය තෝරන්න.

1. රොබට් ඇන්ඩෲස් - රාජාධිරාජසිංහ රජු මුණගැසීම.
2. තෝමස් මෙට්ලන්ඩ් - මැක්ඩෝවල් සෙනවියා උඩරටට යැවීම.
3. රොබට් බ්‍රවුන්රිග් - 1818 නොවැම්බර් 21 උඩරට ප්‍රකාශය නිකුත් කිරීම.
4. ටොරින්ටන් ආණ්ඩුකාරවරයා - රාජාධිරාජසිංහ රජු මුණගැසීම

(24) පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් බෞද්ධ පුනරුද ව්‍යාපාරය සඳහා ඕල්කට් තුමාගේ සේවාවන් ලෙස හඳුනා ගන්නා ක්‍රියාමාර්ග ඇතුලත් පිළිතුර කුමක්ද?

A පංච මහා වාදයන් සඳහා සහය ලබා දීම.

B බෞද්ධ පාසල් අරමුදලක් පිහිටුවීම.

C රුවන්වැලි සෑය නැවත ගොඩනැගීමට කටයුතු කිරීම.

D වෙසක් පොහොය රජයේ නිවාඩු දිනයක් බවට පත්කර ගැනීම.

1. A හා C 2. B හා C 3. B හා D 4. A හා C

- පහත A,B,C හා D යටතේ දක්වා ඇති එක් එක් ප්‍රකාශ යුගලෙහි පළමුවන හා දෙවන අදහස් අතර සම්බන්ධතාවය පරීක්ෂා කරබලා 25 සිට 28 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න,

A - ලංකා සංගමය

මැනිං ඩෙවොන්ෂයර්

B - 1912 සුරාබදු පනත

මධ්‍යම පාන්තිකයින් හා ආගමික පුනරුද නායකයින් එක් අරමුණකට පැමිණීම.

C - අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය

වැටුපට සේවය කරන කම්කරු පිරිසක් බිහි වීම.

D - පැරණි ප්‍රභූ පන්තිය.

නව මධ්‍යම පන්තිය

(25) පළමුවැන්නේ බිඳ වැටීම කෙරෙහි දෙවැන්නේ බිහිවීම දැක්වෙන යුගලය වන්නේ,

1. A 2. B 3. C 4. D

(26) පළමුවැන්න දෙවැන්නෙහි සාර්ථකත්වය කෙරෙහි හේතු වූ ප්‍රකාශ යුගලය වන්නේ ,

1. A 2. B 3. C 4. D

(27) දෙවැන්නෙහි ඇති වීම කෙරෙහි පළමුවැන්නේ නැතිවීම බලපෑ ප්‍රකාශ යුගලය වන්නේ,

1. A 2. B 3. C 4. D

(28) පළමුවැන්න හා දෙවැන්න අතර කිසිදු සබඳතාවක් නොදක්වන ප්‍රකාශ යුගලය වන්නේ,

1. A 2. B 3. C 4. D

(29) 1956 එස් . ඩබ් . ආර් . ඩී බණ්ඩාරණායක අගමැතිතුමාගේ රජය යටතේ හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණයක් වන්නේ මින් කුමක්ද?

1. වරාය සහ බස් ජනසතු කිරීම.
2. බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය සමඟ පැවති ව්‍යවස්ථානුකූල බැඳීම් අවසන් කිරීම.
3. ලංකාව ශ්‍රී ලංකාව යන නාමයෙන් හැඳින්වීම.
4. ශ්‍රී ලංකාව ඒකීය ජනරජයක් බව පිළිගැනීම.

(30) මහවැලි සංවර්ධන යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ ඇතුළත් පිළිතුර කුමක්ද?

A ගංවතුර පාලනය හා මිරිදිය මසුන් බෝ කිරීම.

B වියළි කලාපයේ පැරණි වැව් හා වාරිය මාර්ග අලුත්වැඩියා කර කෘෂිකර්මාන්තයට යොදා ගැනීම .

C තෙත් කලාපයේ පවතින ඉඩම් හිඟය අඩු කිරීම.

D වියළි කලාපයේ ගොවිබිම් සඳහා අවශ්‍ය ජල පහසුකම් සැපයීම .

1. A හා B 2. A හා D 3. B හා D 4. B හා C

(31) පුනරුද සමයේ ඉතාලියේ බිහි වූ ප්‍රකට ගත් කතුවරුන් ඇතුළත් පිළිතුර වන්නේ ?

1. ඩාන්ටේ, පෙට්රාක්, ඉරාස්මස්
2. ඩාන්ටේ, තෝමස් මුවර්, ඉරාස්මස්
2. ෂේක්ස්පියර්, පෙට්රාක්, ඉරාස්මස්
4. ඩාන්ටේ, පෙට්රාක්, බොකැෂියෝ

(32) පුනරුද සමයේ වර්ධනය වූ දේශ ගවේෂන ව්‍යාපාරය හරහා නව රටවල් සහ ප්‍රදේශ සොයාගනු ලැබූ ස්පාඤ්ඤ ජාතිකයින් දෙදෙනෙකු ඇතුළත් පිළිතුර වන්නේ ?

A වස්කෝද ගාමා.

B ක්‍රිස්ටෝපර් කොලොම්බස්.

C පර්ඩිනන්ඩ් මැගලන්.

D බර්තොලමියු ඩයස්

1. A හා B 2. B හා D 3. B හා C 4. C හා D

- පහත දැක්වෙන A හා B යටතේ ඇති තොරතුරු ඇසුරෙන් 33 හා 34 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

A ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය බිඳ වැටීම.

B නාගරීකරණය වේගවත් විම.

(33) කාර්මික විප්ලවය ආර්ථික ක්ෂේත්‍රයේ ඇති කළ වෙනස්කම් සම්බන්ධයෙන්

1. A හා B සත්‍ය වේ.
3 . A සත්‍ය වන අතර B අසත්‍යය වේ.
2. A හා B අසත්‍ය වේ.
4 . A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

(34) කාර්මික විප්ලවය හේතුවෙන් සමාජ ක්ෂේත්‍රයේ ඇති කළ බලපෑම් සම්බන්ධයෙන්

1. A හා B සත්‍ය වේ.
3 . A සත්‍ය වන අතර B අසත්‍යය වේ.
2. A හා B අසත්‍ය වේ.
4 . A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

(35) 1844 දී ස්ථාන දෙකක් අතර විදුලි කම්බියක් යොදා ගනිමින් සංකේත උපයෝගී කරගෙන පණිවිඩ යැවිය හැකි විදුලි පණිවිඩ ක්‍රමය සොයා ගත්තේ කවුද?

1. සැමුවෙල් මෝර්ස්
3 . රොබට් පුල්ටන්
2. ගුග්ලි මාර්කෝනි
4 . හෙන්රි බෙල්

- පහත A සිට F දක්වා දී ඇති ප්‍රකාශ ඇසුරෙන් 36 සිට 38 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

A නිෂ්පාදන කටයුතු හෝ වෙළඳාම සම්බන්ධයෙන් මව් රට සමඟ තරඟ නොකළ යුතු වීම.

B පොදු ජනතාව හා රජු අතර සබඳතාව දුරස් වීම.

C මහද්වීපික හමුදාවක් සංවිධානය කිරීමට තීරණය කිරීම.

D සාර් රජවරුන්ගේ පාලනය සම්පූර්ණයෙන්ම බිඳ දැමීම

E මොන්ටෙස්ක්‍යු , වෝල්ටෙයාර් සහ රූසෝ යන අයගේ දාර්ශනික අදහස්

F සමාජවාදී දර්ශනය පිළිගත් රටක් බිහි වීම.

(36) ඇමරිකානු විප්ලවය සම්බන්ධයෙන් නිවරැදි කරුණු ඇතුළත් පිළිතුර කුමක්ද ?

1. A හා C 2. B හා D 3. C හා D 4. D හා F

(37) ප්‍රංශ විප්ලවයට බලපෑ හේතු සම්බන්ධයෙන් නිවරැදි කරුණු ඇතුළත් පිළිතුර කුමක්ද ?

1. A හා B 2. B හා E 3. C හා E 4. E හා F

(38) රුසියන් විප්ලවයේ ප්‍රතිඵල සම්බන්ධයෙන් නිවරැදි කරුණු ඇතුළත් පිළිතුර කුමක්ද ?

1. A හා C 2. B හා C 3. D හා F 4. E හා F

(39) පළමු ලෝක යුධ සමයේ දී මධ්‍ය බලවතුන්ගේ කඳවුරට අයත් රටවල් දැක්වෙන පිළිතුර කුමක්ද ?

1. ඉතාලිය, ප්‍රංශය, ජර්මනිය
2. ඉතාලිය, ප්‍රංශය, ඔස්ට්‍රියාව
3. ඉතාලිය, ප්‍රංශය, පර්සියාව
4. ඉතාලිය, ඔස්ට්‍රියාව, ජර්මනිය

(40) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රධාන අධිකරණය වන ජාත්‍යන්තර අධිකරණය පිහිටා ඇත්තේ ?

1. හේග් නුවර
2. නිව්යොක් නුවර
3. ජිනීවා නුවර
4. ලන්ඩන් නුවර